# ව්‍යාකරණ සංගායනාවක් ?

– තියොබෝල්ඩ් මුතුගලගේ
(ශාස්ත්‍රවේදී, අධ්‍යාපන විද්‍යා ඩිප්ලෝමා)

මෙහි පළ වන මේ ලිපිය, ම විසින් ලියන ලදු වැ, 1958 ජූලි 25 දින (මීට වසර 50 කට පෙරාතු ව) පළ වූ, දින දින සඟරාවෙන් (අංක 532 ගාලු පාර, කොල්ලු පිටිය, නැ. පෙ. 934) උපුටා ගන්නා ලද්දෙකි.

වර්තමානයේ දී මා දරන අදහස වනුයේ, ව්‍යාකරණයට පමණක් නො ව, අක්ෂර වින්‍යාසය, විරාම ලකුණු, පද බෙදීම ඇතුළත් ව, ව්‍යාකරණ සංගායනාවක් ඉක්මනින් ම ආරම්භ කළ යුතු බව ය.

- **පාසල් සිසුනට ව්‍යාකරණ පාඩම් බරෙක් ද ?**
- **ව්‍යාකරණ උගැන්වීමේ දී හමු වන දුෂ්කරතා කවරේ ද ?**
- **ව්‍යාකරණ පාඩම් පාසල්හි විෂය මාලාවෙන් ඉවත් කළ යුත්තේ ද ?**
- **සම්මත ව්‍යාකරණ පද්ධතියක් සකස් කළ යුතු ද?**

පාසල්හි ව්‍යාකරණ උගැන්විය යුතු ද? නැද්ද? යන්න, මෑ'තක සිට මහත් ප්‍රශ්නයක් වැ පැවැතෙ'යි. ඊට හේතුව, විවිධ මත දරන්නන් ගේ පත-පොත යි. සමහර පාසල්හි, ප්‍රාථමික පන්තියේ දී පවා ව්‍යාකරණයට මුල් තැනක් දී උගැන්වීම් කරති. එ සේ ම තවත් සමහරෙක, ව්‍යාකරණ නාමය පවා සඟවා ව්‍යාකරණය තොන් කරු